අපේක්ෂිත ප්‍රතිලාභ

සුරක්ෂිත වාසස්ථානයක්, සුරක්ෂිත පරිසරයක්, ඵලදායී සෞඛ්‍ය ආරක්ෂිත සමාජයක් !




ඔබ රසායනික සුරක්ෂිතතාවය පිළිබඳ දැන ගත යුත්තේ ඇයි ?

* රසායනික නිසා සිදුවිය හැකි අනතුරු හා රෝග වළක්වා ගැනීමට.

* භයානක පිපිරීම් හා ගිනි ගැනීම් වළක්වා ගැනීමට




කර්මාන්තශාලාවේ සහ නිවසේ භාවිතා කරන සමහර රසායනිකයන් ඔබට අහිතකරයි. එමගින් සිදුවිය හැකි උපද්‍රවයන් ගැන හැදෑරීමෙන් ඔබට අනතුරු වලක්වා ගත හැකිය. ඒ සඳහා ඔබගේ සහයෝගය අත්‍යාවශ්‍යයි.




රසායනිකවල අපරීක්ෂාකාරී භාවිතය නිසා

* පිපිරීම් හා ගිනිගැනීම්
* විෂවීම්
* ජලය සමග ප්‍රතික්‍රියාවන්
* බාදනයට ලක්වීම්

සිදුවිය හැකිය.




රසායනිකයන් ඔබගේ

* මුඛයෙන්
* නාසයෙන්
* සමතුළින්

ඔබගේ ශරීරය තුළට ඇතුලු විය හැකිය. එම රසායනිකයට ඔබ නිරාවරණය වන කාලය, එම රසායනිකයේ සාන්ද්‍රණය සහ වර්ගය අනුව හානියේ ප්‍රමාණය තීරණය වේ.

ඔබ විසින් කළ යුතු දෑ

1. රසායනිකය පිළිබඳ ආරක්ෂිත දත්ත තොරතුරු පත්‍රිකාව (Material Safety Data Sheet - M. S. D. S) කියවා රසායනිකය හඳුනා ගන්න.

2. රසායනිකය භාවිතා කරන පිළිවෙත හා ගබඩා කරන පිළිවෙත දැන ගන්න.

3. උපද්‍රවයන් සිදුකරන රසායනිකයන් වෙනුවට උපද්‍රව අඩු වෙනත් රසායනිකයන් භාවිතා කළ හැකිය.

4. භාවිතා කරන සාන්ද්‍රණය හා පිළිවෙත වෙනස් කළ හැකිය.

5. රසායනික නිසා දූෂිත වාතය ඉවත් කිරීමේ හා පිරිසිදු වාතය ලබා ගැනීමේ සැලැස්මක් ඇති කළ හැකිය.

6. රසායනික භාවිත කරනු ලබන ප්‍රදේශය හුදකලා (වෙන්) කළ හැකිය.

7. රසායනිකයන්ට නිරාවරණය වන කාලය සීමා කල හැකිය.




## ඔබගේ වගකීම

- රසායනික දැන හඳුනා ගන්න.
- නිවැරදිව ප්‍රවාහනය හා ගබඩා කරන්න.
- නිර්දේශිත පුද්ගල ආරක්ෂක උපකරණ භාවිතා කරන්න.
- අනතුරකදී වහාම ක්‍රියාත්මක වන්න.




සිහි තබා ගන්න !!!!!!!!!...............

- සැමවිටම නිවැරදි සුරක්ෂිත ක්‍රියා
- හොඳ සෞඛ්‍ය පුරුදු
- නිවැරදි සහ ඉක්මන් ප්‍රථමාධාර

ප්‍රගුණ කිරීමෙන් ඔබට, ඔබගේ මිතුරන්ට සහ සහෝදර සේවක සේවිකාවන්ට ආදර්ශවත් නායකත්වයක් දිය හැකිය.




*අපගේ ලිපිනය*

කම්කරු කොමසාරිස් (කර්මාන්තමය සුරක්ෂිතතා) හා
ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය

කර්මාන්තමය සුරක්ෂිතතා අංශය,
255/6, කිරුළ පාර,
කොළඹ - 05.

දුරකථනය : 011-2368258
011-2368322
ෆැක්ස් : 011-2368258

කම්කරු සබඳතා හා
විදේශ රැකියා නියුක්ති අමාත්‍යාංශය

කම්කරු දෙපාර්තමේන්තුව

කර්මාන්තමය සුරක්ෂිතතා අංශය

# රසායනිකයන් සුරක්ෂිත ලෙස පරිහරණය කිරීම

## අරමුණ

කර්මාන්තයන්හි සහ නිවසේ භාවිතා කරනු ලබන සියලුම රසායනික වලින් සිදුවන අනතුරු වළක්වා ගැනීම.



## ඉලක්කය

කර්මාන්තශාලාවල සහ නිවාස වල රසායනික ද්‍රව්‍ය හා ගැටෙන ලක්ෂ සංඛ්‍යාත වූ ඔබයි.